# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.05 පැය 0100 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/648/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. යතුරු පැදි සොරකමක් හා රන් මාල කොල්ලකෑමේ අපරාධ වලට අවශ්‍යකර සිටි සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - මොරටුව පොලිස් ස්ථානය.**

2025.04.04 වන දින දහවල් කාලයේ මොරටුව පොලිස් වසමේ රාවතාවත්ත ප්‍රදේශයේදී මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 280 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන කළුතර උතුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධයෙන් සිදු කළ විමශර්නයේදී මොහු කළුතර උතුර පොලිස් වසමේදී යතුරු පැදි සොරකමක්, පිංවත්ත හා මොරොන්තුඩුව පොලිස් වසම්වලදී ගෙල බැඳි රන් මාල කොල්ලකෑමේ සිද්ධීන් දෙකකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු බවටත්, මොහුට කළුතර ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු තුනක් සඳහා විවෘත වරෙන්තු හා පානදුර ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් වරෙන්තු නිකුත්ව ඇති බවටත් වැඩිදුර විමශර්නයේදී අනාවරණය වී ඇත.

තවද මෙම සැකකරුගෙන් අනාවරණය වූ තොරතුරු මත 2025.04.04 වන දින සවස් කාලයේ අගුලාන ප්‍රදේශයේදී කොල්ලකන ලද රන් මාල දෙක උකස් තබන ලද සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇති අතර එම රන් මාල දෙක උකස් කර තිබියදී හා සොරකම් කරන ලද යතුරු පැදිය සැකකරු විමශර්න නිලධාරීන් විසින් සොයාගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 22 ක් වන අඟුලාන ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මොරටුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. ගජමුතු 02 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දිවුලපිටිය පොලිස් ස්ථානය.**

2025.04.04 වන දින දහවල් කාලයේ දිවුලපිටිය නගරයේදී දිවුලපිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර රුපියල් ලක්ෂ 15 ක මුදලකට අලෙවි කිරීමට සූදානම් කර තිබූ **ග්‍රෑම් 16 මිලිග්‍රෑම් 970 ක් බර ගජමුතු 02 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන නාගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු 2025.04.05 වන දින මිනුවන්ගොඩ ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.දිවුලපිටිය පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු සහ සැකකාරියක් අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2025.04.04 වන දින රාත්‍රී කාලයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ස්ටේස් පාර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් දෙකක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 110 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු සහ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 150 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් හා සැකකාරිය වයස අවුරුදු 38 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - ඇල්පිටිය පොලිස් වසම.

2025.04.04 වන දින රාත්‍රී කාලයේ ඇල්පිටිය පොලිස් වසමේ ඇල්පිටිය කහදූව මාගර්යේ 05 කණුව ප්‍රදේශයේදී කහදූව දෙස සිට ඇල්පිටිය දෙසට ධාවනය වූ යතුරු පැදියක් මාගර්ය හරහා ගමන් කළ කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් එම කාන්තාව හා යතුරු පැදිකරු තුවාල ලබා ඇල්පිටිය රෝහල වෙත ඇතුලත් කිරීමෙන් පසු කාන්තාව මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 57 ක් වූ කහදූව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය ඇල්පිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ඇල්පිටිය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**